# 50. සිනමා ශාලා / රඟහල / රංගන ශිල්පීන්

**හැඳින්වීම:** සිනමා ශාලාව, රඟහල යනු වැඩිපුර සෙනග ගැවසෙන ස්ථානයකි. විශේෂයෙන්ම සිනමාහලට ඇතුළුවීමේ දී හා පිටවීමේ දී ඇතිවන තදබදය සහ සීමිත සංවෘත ස්ථානයක පැය කිහිපයක් සිටීමට සිදුවන නිසාත් විශේෂ පූර්වෝපාය අනුගමනය කල යුතු වේ.

**විශේෂිත පණිවිඩය / උපදෙස්**

**කළමනාකරණය සඳහා**

- සිනමාහලේ සේවකයන්ට තමන් ගේ පුද්ගලික ආරක්ෂාව පිලිබඳව පුහුණුවීම් කල යුතුය. නිවැරදි ආකාරයට මුහුණු ආවරණ පැළඳීම, අත් සේදීම, කිවිසීමේදී හා කැස්සකදී වැලමිටෙන් හෝ ටිෂු එකකින් මුහුණ ආවරණය කරගැනීම හා පාරිභෝගිකයන් අතර පුද්ගල දුරස්තථතවය තබා ගැනීම පිලිබඳව වැඩි අවධානයක් යොමු කල යුතුය.
- සේවකයන් ගේ සෞඛ්‍ය තත්වය දිනපතා පරික්ෂ කිරීමේ ක්‍රමවේදයක් සකස්කළ යුතුය. අයහපත් සෞඛ්‍ය තත්වයක් ඇති සේවකයින් වහාම ප්‍රතිකාර සඳහා යොමුවිය යුතුය
- සිනමාහලේ ආසන සැකසීමේ දී, අසුනක් හැර අසුනක් භාවිත කිරීමට හැකිවන ලෙස අසුනක් හැර අසුනක් ටේප් පටියකින් කතිරයක් ඇඳ තබන්න
- සිනමාහලේදී පිළිපැදිය යුතු පූර්වරක්ෂණ ක්‍රියාමාර්ග පිලිබඳව දැනුවත් වීම සඳහා, සිනමාහලේ හා ප්‍රවේශපත් ලබාගැනීමේ වෙබ් අඩවියේ පූර්වාරක්ෂක සංඥා ප්‍රදර්ශනය කල යුතුය.
- සිනමාහලේ දී පිළිපැදිය යුතු පූර්වරක්ෂණ ක්‍රියාමාර්ග පිලිබඳව දැනුවත් කිරීමක් චිත්‍රපටය හෝ නාට්‍ය පටන්ගැනීමට පෙර කල යුතුය.
- පාරිභෝගිකයන්ට සිනමාහලට ඇතුළුවීමට පෙර අත් සේදීම පහසු වන පරිදි පාදයෙන් ක්‍රියාත්මක වන හෝ සංවේදක මගින් ක්‍රියාත්මකවන අත්සේදුම් ස්ථානයක් ස්ථාපිත කල යුතුය. එසේ නැතිනම් ඇල්කොහොල් අඩංගු අත්සේදුම්කරක දියරය ඇතිතරම්, ප්‍රවේශ පත් ලබාගැනීමේ කවුන්ටරයේද සිනමාහලට ඇතුළුවන ස්ථානයේ හා වෙනත් ස්ථාන කිහිපයකම තැබිය යුතුය
- සිනමාහල තුල වාතාශ්‍රය වැඩි කිරීමට කටයුතු කරන්න. වායුසමීකරණ යන්ත්‍ර තිබෙන්නේ නම් ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වන්නේදැයි පරීකෂා කර බලන්න.
- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන තුරු සිනමා ශාලා හා රඟහල් ක්‍රියාත්මක විය හැක්කේ 50% ක ධාරිතාවයකින් පමණි. මෙමගින් අදහස් කරන්නේ ආසනයක් හැර අනෙක් ආසනය නිකුත් කල හැකි බවය. පවුලේ සාමාජිකයින්ට එකලඟ ඇති ආසනවල හිඳගත හැක.
- දැනුම්දෙන තෙක් චිත්‍රපටය අතරතුර විවේක කාලයට ඉඩ දෙනු නොලැබේ.
- පෝලිම් වල සිටින වෙලාව අවම කර ගැනීම සඳහා හැකි සෑමවිටම අන්තර්ජාලය මගින් ආසන වෙන්කිරීම හා මුදල් ගෙවීම කරන්න. ආසන වෙන් කිරීමේ දී , පාරිභෝගිකයාගෙන් ස්වසන රෝග තත්වයන් (කැස්ස, උගුරේ වේදනාව) ගැන විමසීමක් කරන්න.
- චිත්‍රපට දෙකක් අතර අවම වශයෙන් පැයක් පමණ විරාමයක් පැවතිය යුතු අතර , එම කාලයේ දී, සිනමා හල තුල සියලුම පොදු පෘෂ්ඨ, ආසන හා දොර හැඩල,සෝපාන බොත්තම් විෂබීජහරණය කල යුතුය.
- පරිභෝගිකින් දොරවල් හැසිරීම අවම කිරීමට සිනමාහල තුල දොරවල් නිරතුරුව විවෘතව තැබීමට කටුයතු කරන්න
- චිත්‍රපට නරඹන ශාලාවට ඇතුල්වීමට පෙර අවශ්‍ය ආහාර පාන විකිණීමේ නිවැරදි ක්‍රමවේදයක් සකසන්න. චිත්‍රපටය නරඹන ශාලාව තුල ආහාර පාන බෙදාහැරීම හෝ විකිණීම නොකල යුතුය
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සිනමාහලේ හෝ රඟහලේ හිමිකරු / භාරකරුගේ වගකීම වේ.
- ත්‍රිමාණ ඇස් කන්නාඩි භාවිත කරන්නේ නම් එම කන්නාඩි එක්වරක් භාවිත කිරීමෙන් පසුව විෂබීජහරණය කල යුතුය
- නාන කාමර, ඇඳුම් මාරු කිරීමේ කුටි, ප්‍රමාණවත් ලෙස වාතාශ්‍රය ලැබෙන ලෙස සලසා තිබිය යුතු අතර නිරතුරුව පිරිසිදු කිරීමට වගබලාගත යුතුය. පිරිසිදු කිරීමේ සටහනක් පවත්වා ගැනීම වැදගත් වේ.

සිනමාහලේ සේවකයන් සඳහා

- සේවකයන් නිවැරදිව මුහුණු ආවරණ පලදීම , නිතර අත් සේදීම , කිවිසින විට හා කහිනවිට ටිෂූ හෝ වැලමිටෙන් මුහුණ ආවරණය කරගැනීම හා මීටරයක පුද්ගල දුරස්ථානාවය තබාගැනීම කෙරිහි අවදානය යොමුකළ යුතුය
- ඔබට උණ, කැස්ස, උගුරේ වේදනාව ඇත්නම්  සේවයට පැමිණීමෙන් වලකින්න
- සිනමාහලට පිවිසෙන ස්ථානය, සෝපානය හා ප්‍රවේශ පත්‍ර නිකුත්කරන ස්ථානය පිරිසිදුව තබාගැනීමට කටයුතු කරන්න
- ප්‍රවේශ පත් ලබාගැනීමට පෝලිමේ සිටින විට මීටරයක දුර පවත්වා ගැනීමට කටයුතු කරනලෙස පාරිභෝගිකයන්ට නිරතුරුව සිහිකැදවීමට කටයුතු කරන්න.
- ප්‍රවේශපත් නිකුත්කරන සේවකයන් නිරතුරුව ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කරකයකින් දෑත් පිරිසිදු කිරීමට වගබලාගන්න. තවද්ද ප්‍රවේශපත් පරීක්ෂාකරන සේවකයන් පාරිභෝගිකයන් ගේ ප්‍රවේශපත් ඇල්ලීමෙන් වැළකිය යුතු ය. ප්‍රවේශපත්‍ර සලකුණු කිරීමට ප්‍රවේශ පත්‍ර සිදුරු කිරීමේ යන්ත්‍රයක් භාවිත කරන්න.
- පාරිභෝගිකයන් සිනමාහලට ඇතුල් වීමට පෙර ඔවුන්ගේ ස්වසන රෝගී තත්වයන් (කැස්ස, උගුරේ වේදනාව) ගැන විමසීමට හා අධෝරක්ත කිරණ මගින් ශරීර උෂ්ණත්වය මනින උපකරණයක් (ස්පර්ශ නොකරන උෂ්ණත්වමානයක්) මගින් ශරීර උෂ්ණත්වය මැනීමට වගබලාගන්න.
- පාරිභෝගිකයන් ඔවුන්ගේ මුහුණු ආවරණ පලදිනවද යන්න හා මීටර එකක ශාරීරික දුරස්තථතවය පවත්වා ගන්නවද යන්න සොයාබැලීමට වගබලාගන්න.
- චිත්‍රපටය අවසානයේ ප්‍රේක්ෂකයන් පිටව යද්දී, පේලියෙන් පේලිය පිට වීමට කටයුතු සැලසිය යුතුය
- එක් එක් ප්‍රසංගය හෝ නාට්‍යය අවසානයේ මයික්‍රෆෝනය විෂබීජහරණය කරන්න.

රංගන ශිල්පීන් සඳහා

- සෑම විටම මීටර 1ක ශාරීරික දුරස්ථභාවය තබා ගැනීමට උත්සහ කිරීම, නිවැරදි ශ්වසන ආචාර විධි පවත්වා ගැනීම සහ අවශ්‍ය විට නිවැරදිව මුහුණු ආවරණ පැළඳීම වැදගත් වේ
- වේශ නිරූපණ ශිල්පීන්, වේශ නිරූපණයේදී මුහුණු ආවරණයක් භාවිත කල යුතු අතර, වේශ නිරූපන බුරුසු, ස්පොන්ජි, හා අනෙකුත් දෑ අන් අය සමඟ හවුලේ භාවිත කිරීමෙන් වලකින්න.
- නිතර ස්පර්ශ වන පෘෂ්ඨයන් හා උපකරණ අනවශ්‍ය ලෙස භාවිතයෙන් වැළකිය යුතුය
- සෑම රංගනයකට පෙර හා පසු  ඔබේ දෑත් උපදෙස් දී ඇති පරිදි සබන් හා වතුරෙන් හෝ ඇල්කොහොල් අඩංගු අත් පිරිසිදුකාරකයකින්  සේදිය යුතු ය.
- ඔබට අසනීප බවක් දැනෙන්නේනම් (ඔබට උණ / කැස්ස / උගුරේ අමාරුව වැනි රෝග ලක්ෂණ ඇත්නම්) වැඩසටහනට සහභාගී වීමෙන් වලකින්න.
- පිටස්තර පුද්ගලයින් සමඟ අනවශ්‍ය ලෙස කතාබස් කිරීමෙන් හා සෙල්ෆි / ඡායාරූප ගැනීමෙන් වළකින්න
- නිවසට පැමිණි පසු ස්නානය කරන්න. ඇඳ සිටි ඇඳුම් සෝදන්න
- වතුර බෝතල්, කෝප්ප හෝ අනෙකුත් දෑ අන් අය සමඟ බෙදා නොගන්න
- අතට අත දීම, පහක් දැමීම හෝ සිප වැළඳගැනීම් වැනි එකිනෙකා අතර ගැටෙන ක්‍රියාකාරකම් වලින් වළකින්න
- මත්පැන් පානය කිරීම තහනම්ය

පාරිභෝගිකයින් සඳහා

- ඔබට උණ හෝ කැස්ස / උගුරේ අමාරුව වැනි ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් සිනමා ශාලාවට හෝ රඟහලට ඇතුළු නොවන්න.
- සිනමා ශාලාවට හෝ රඟහලට  ඇතුළු වන විට සහ පිටවන විට තත්පර 20 ක් සබන් හා වතුරෙන් ඔබේ අත් සෝදන්න, ටිකට් පත් සහ වෙනත් පොදු ස්පර්ශක පෘෂ්ඨ සහ දොර හැඳල වැනි දෑ  හැසිරවීමෙන් පසු ඇල්කොහොල් අඩංගු අත් සනීපාරක්ෂක යොදා අත් පිරිසිදු කරගන්න.
- සියලුම පාරිභෝගිකයන් මුහුණු ආවරණ පැළඳිය යුතු අතර එකිනෙක අතර මීටර එකක පුද්ගල දුරස්තථතවය  තබාගත යුතුය
- හැකි සෑමවිටම ප්‍රවේශපත්‍ර කල්තිය මිලදීගැනීමට කටයුතු කරන්න
- සියලුම පාරිභෝගිකයන් ස්වසන ආචාර විධි පිළිපැදිය යුතු අතර නිතර ස්පර්ශවන පෘෂ්ඨයන් ස්පර්ශ නොකිරීමට වගබලාගත යුතුය

- ආසන පනවා ඇති ආකාරයට (අසුනක් හැර අසුනක) වාඩිවිය යුතු අතර පවුලේ සාමාජිකයින්ට එකලඟ ඇති ආසනවල හිඳගත හැක.
- චිත්‍රපටය හෝ සංදර්ශනය නරඹන ශාලාව තුලට ආහාර පාන රැගෙන යන්නේ නම්, ඒවා සිනමා ශාලාවට හෝ රඟහලට  ඇතුල්වීමට පෙර ලබා ගන්න.
- චිත්‍රපටය හෝ සංදර්ශනය පටන්ගැනීමට පෙර තැන තැන වල එක්රැස් වීමෙන් වලකින්න
- චිත්‍රපටය හෝ සංදර්ශනය අවසානයේ පිටවයනවිට කළමනාකාරීත්වය විසින් නිවේදනය කර ඇති ආකාරයට පිටවීමට වගබලාගන්න

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

සිනමාහලේ හෝ රඟහලේ දී අනුගමනය කලයුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග පිලිබඳව සංඥා මගින් ශාලාවට ඇතුල් වන ස්ථානයේ දී, ප්‍රවේශපත්‍ර ලබාගැනීමේ වෙබ් අඩවි වල  හා චිත්‍රපටය හෝ සංදර්ශනය පටන් ගැනීමට පෙර ප්‍රදර්ශනය කල යුතුය.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.